# SMB ෆිනෑන්ස් පීඑල්සී

**ප්‍රධාන කරුණු ලේඛනය**

SMB ෆිනෑන්ස් පීඑල්සී පාරිභෝගිකයන් වෙත පිරිනමන ප්‍රධාන පහසුකම් / සේවා අංගයන් මෙම ලේඛණයෙහි අන්තගර්ත වේ. 2018 අංක 01 දරන මුල්‍ය කල්බදු පනතේ උපදේශයන්ට අනුකූලව "මුල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව" යටතේ ප්‍රකාශයට පත්කර ඇති මෙම ප්‍රධාන කරුණු ලේඛනය www.smblk.com ආයතනික වෙබ් අඩවියේ ඇතුලත්කර ඇති අතර, අනාගත ගනුදෙනුකරුවන්ට එම වෙබ් අඩවිය හරහා ලබා ගත හැකිය.

## 1.0 පහසුකම් හා සේවා - ණය

අපගේ පාරිභෝගිකයන් වෙත පහත සඳහන් පහසුකම් හා සේවාවන් අප පිරිනමන්නෙමු.

| පහසුකම් නාමය | නිනර්යක | විස්තරය |
|---|---|---|
| මූල්‍ය කල්බදු (ලීසිං) | සේවාවන්හි ස්වභාවය සහ ලක්ෂණ | ❖ වැටුප් ලබන සේවාදායකයින්, තනි පුද්ගල ව්‍යාපාරයකයින්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරකයින් අතුලු අනිකුත් ආයතනික ව්‍යුහයන් හට මෙම කල්බදු පහසුකම යටතේ පහසුකම් සැපයේ.<br>❖ ලියාපදිංචි කල/නොකල වාහන සහ තෝරගත් යන්ත්‍රෝපකරණ ( විශේෂ අනුමැතියක් මත) ආදිය සඳහා ලීසිං පහසුකම් සැපයේ. |
| | සේවාවන්හි නියම සහ කොන්දේසි | ❖ වයස - පුද්ගලයින් සඳහා අවුරුදු 18ත් 60ත් අතර විය යුතුය.<br>❖ උපරිම කල්බදු කාලය වසර හතක් සඳහා වේ.<br>❖ අනන්‍යතාවය තහවුරු කිරිමට - ජාතික හැඳුනුම්පත/ව්‍යාපාර ලියාපදිංචි සහතිකය/ ආකෘකිපත්‍ර 1 හෝ ආකෘතිපත්‍ර 40/ ආකෘතිපත්‍ර 20/ආයතනික ව්‍යවස්ථා සංග්‍රහය.<br>❖ ආදායම තහවුරු කිරිමට - මුල් පිටපත් හෝ සහතික කරන ලද වැටුප් පත්‍රිකා/ බැංකු ප්‍රකාශන/ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකශන හෝ වෙනත් ආදායම තහවුරු කල හැකි ලියවිලි.<br>❖ ස්ථිර පදිංචිය තහවුරු කිරිමට - උපයෝගිතා බිල්පත්/ ග්‍රාම නිලධාරී සහතික (පුද්ගලයින් සඳහා) /ව්‍යාපාර ලියාපදිංචි සහතිකය/ ආකෘතිපත්‍ර 13 (ආයතනික ව්‍යුහයන් සඳහා) ඉදිරිපත් කල යුතුයි.<br>❖ අනන්‍යතාවය තහවුරු කලහැකි/ආදායම සහතික කලහැකි/ ස්ථිර පදිංචිය සනාථ කිරීමට හැකි පිළිගතහැකි ඇපකරුවන් දෙදෙනෙක් අවශ්‍ය වේ.<br>❖ මෝටරර්ථ කොමසාරිස් දෙපාතර්මේන්තුවේ ලියාපදිංචිය සඳහා අවශ්‍ය වාහනයේ ලියකියවිලි සැපයිය යුතුය.<br>❖ මෙම පහසුකම ලබාදීමට පෙර බදුකරුගේ හා ඇපකරුවන්ගේ CRIB ණය වාතර්ා විශ්ලේශණය කෙරේ.<br>❖ ලියාපදිංචි/ප්‍රතිසංස්කරණය කරන ලද වාහන - ශ්‍රී ලංකා කල්බදු සංගමයේ ලියාපදිංචි අනුමත තක්සේරුකරුවකුගෙන් වාහන තක්සේරු වාතර්ාවක් ලබාගත යුතුය.<br>❖ නවතම වාහන සඳහා - ශ්‍රී ලංකාවේ නියෝජිතවරයෙකු ගෙන් ලබාගත් නාමමාත්‍ර ඉන්වොයිස් පත්‍රය (Pro forma invoice) ඉදිරිපත් කල යුතුයි.<br>❖ නිරාවරණ සීමාව පාරිභෝගිකයාගේ ආපසු ගෙවීමේ හැකියාව මත පදනම් වන අතර, එය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කලට නිකුත්කෙරෙන ණය/අගය අනුපාත උපදෙස් නොඉක්මවනු ඇත.<br>❖ වත්කම අදාළ සියලුම අවදානම් වලට එරෙහිව විස්තීරණ ලෙස රක්ෂණය කළ යුතු අතර, රක්ෂණ හිමිකම් සහතිකය SMB ෆිනෑන්ස් පීඑල්සී ආයතනය වෙත පැවරිය යුතුය.<br>❖ ප්‍රධාන ගිවිසුමේ සහ අතිරේක නියමයන් සහ කොන්දේසි දක්වා ඇති ලේඛනයේ අඩංගු අනෙකුත් කොන්දේසි මේ සඳහා අදාල වේ. |
| කඩිනම් මුදල් ණය | සේවාවන්හි ස්වභාවය සහ ලක්ෂණ | ❖ රජයේ/අනුමත පුද්ගලික අංශයේ වැටුප් ලබන සේවකයින් සඳහා හඳුන්වා දී ඇත.<br>❖ වැටුප් ලබන සේවකයෙකුගේ විවිධ පෞද්ගලික අවශ්‍යතා ඉටුකර ගැනීමට මූල්‍යාධාර සපයයි. |

| | | |
|---|---|---|
| | සේවාවන්හි නියම සහ කොන්දේසි | ❖ වයස - රාජ්‍ය සේවකයින් සඳහා අවුරුදු 18 සිට අවුරුදු 60 දක්වාත්, පෞද්ගලික අංශයේ සේවකයින් සඳහා අවුරුදු 18 සිට අවුරුදු 55 දක්වාත් විය යුතුය.<br>❖ උපරිම ණය මුදල මාසික මූලික වැටුප සහ ස්ථිර දීමනා මෙන් දස ගුණයකි.<br>❖ අවම වැටුප (මූලික වැටුප + ස්ථිර දීමනා) මසකට රුපියල් 15,000/- කි.<br>❖ උපරිම ණය කාලය අවුරුදු 4කි.<br>❖ අනන්‍යතාවය තහවුරු කිරිමට - ජාතික හැඳුනුම්පත<br>❖ ආදායම තහවුරු කිරිමට - පසුගිය තුන් මාසයේ මුල් පිටපත් හෝ සහතික කරන ලද වැටුප් පත්‍රිකා/ බැංකු ප්‍රකාශනවල මුල් පිටපත් හෝ සහතික කළ පිටපත් හෝ වෙනත් ආදායම තහවුරු කල හැකි ලියවිලි.<br>❖ ස්ථිර පදිංචිය තහවුරු කිරිමට - උපයෝගිතා බිල්පත්/ ග්‍රාම නිලධාරී සහතික<br>❖ අනන්‍යතාවය තහවුරු කලහැකි/ආදායම සහතික කලහැකි/ ස්ථිර පදිංචිය සනාථ කිරීමට හැකි පිළිගතහැකි ඇපකරුවන් දෙදෙනෙක් අවශ්‍ය වේ.<br>❖ වසරක සේවා කාලයක් සම්පූර්ණ කළ ස්ථිර සේවකයෙකු විය යුතුය.<br>❖ සමස්ත අඩුකිරීම් මාසික වැටුපෙන් 60% නොඉක්මවිය යුතුය.<br>❖ මෙම පහසුකම ලබාදීමට පෙර බදුකරුගේ හා ඇපකරුවන්ගේ CRIB ණය වාර්තා විශ්ලේශණය කෙරේ.<br>❖ මාසික ණය වාරිකය වැටුපෙන් අඩුකරන බවට සේවා යෝජකයාගේ එකඟ වීමේ ලිපිය.<br>❖ ණය පිරිනැමීමේ ලිපියෙහි, පහසුකම් ගිවිසුමෙහි සහ අතිරේක නියමයන් සහ කොන්දේසි දක්වා ඇති ලේඛනයේ අඩංගු අනෙකුත් කොන්දේසි මේ සඳහා අදාල වේ. |
| කාලීන ණය | සේවාවන්හි ස්වභාවය සහ ලක්ෂණ | ❖ ව්‍යාපාරවල කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා වන ඉල්ලුම සපුරා දීමට හෝ ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීමට සහ, පුද්ගලයින්ගේ පුද්ගලික මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා හඳුන්වා දී ඇත.<br>❖ දේපල, වාහන සහ පුද්ගලික ඇපකර ආරක්ෂිත ඇප වශයෙන් ඉදිරිපත් කළ හැකිය. ණය අවදානම් සාධක මත පදනම්ව, පහසුකම් අනුමත කිරීමේ අධිකාරිය විසින් ණය මුදලෙහි වටිනාකම සහ ප්‍රමාණවත් වන ආරක්ෂිත ඇප තීරණය කරනු ඇත. |
| | සේවාවන්හි නියම සහ කොන්දේසි | ❖ වයස - පුද්ගලයින් සඳහා අවුරුදු 18ත් 60ත් අතර විය යුතුය.<br>❖ උපරිම ණය කාලය අවුරුදු 5කි.<br>❖ අනන්‍යතාවය තහවුරු කිරිමට - ජාතික හැඳුනුම්පත/ව්‍යාපාර ලියාපදිංචි සහතිකය/ ආකෘතිපත්‍ර 1 හෝ ආකෘතිපත්‍ර 40/ ආකෘතිපත්‍ර 20/ආයතනික ව්‍යවස්ථා සංග්‍රහය.<br>❖ ආදායම තහවුරු කිරිමට - මුල් පිටපත් හෝ සහතික කරන ලද වැටුප් පත්‍රිකා/ බැංකු ප්‍රකාශන/ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකශන හෝ වෙනත් ආදායම තහවුරු කල හැකි ලියවිලි.<br>❖ ස්ථිර පදිංචිය තහවුරු කිරිමට - උපයෝගිතා බිල්පත්/ ග්‍රාම නිලධාරී සහතික (පුද්ගලයින් සඳහා) /ව්‍යාපාර ලියාපදිංචි සහතිකය/ ආකෘතිපත්‍ර 13 (ආයතනික ව්‍යුහයන් සඳහා) ඉදිරිපත් කල යුතුයි.<br>❖ අනන්‍යතාවය තහවුරු කලහැකි/ආදායම සහතික කලහැකි/ ස්ථිර පදිංචිය සනාථ කිරීමට හැකි පිළිගතහැකි ඇපකරුවන් දෙදෙනෙක් අවශ්‍ය වේ.<br>❖ මෙම පහසුකම ලබාදීමට පෙර බදුකරුගේ හා ඇපකරුවන්ගේ CRIB ණය වාර්තා විශ්ලේශණය කෙරේ.<br>❖ දේපල උකස් ණය සඳහා අදාල දේපල සම්බන්ධ ලිපි ලේඛන සැපයිය යුතුය.<br>❖ නිශ්චල දේපල සඳහා - ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති නිර්ණායක තුල වෘත්තීය තක්සේරු කරුවෙකුගෙන් තක්සේරු වාර්තාවක් ලබාගත යුතුය.<br>❖ වාහන උකස් ණය සඳහා මෝටර්රථ කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචියට අවශ්‍ය වාහනයේ ලියකියවිලි සැපයිය යුතුය.<br>❖ නිශ්චල දේපල මත උකස් කිරීම් සඳහා නිරාවරණ සීමාව පවතින විකුණුම් වටිනාකමෙන් 70% දක්වා වනු ඇත. |

| | | |
|---|---|---|
| | | ❖ වාහන උකස් ණය සඳහා නිරාවරණ සීමාව පාරිභෝගිකයාගේ ආපසු ගෙවීමේ හැකියාව මත පදනම් වන අතර (එනම් මාසික ආදායමෙන් අවම 1.25 ගුණයක් වන්නේ නම්) සහ එය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කලට නිකුත්කෙරෙන ණය/අගය අනුපාත උපදෙස් නොඉක්මවනු ඇත.<br>❖ ලියාපදිංචි/ප්‍රතිසංස්කරණය කරන ලද වාහන - ශ්‍රී ලංකා කල්බදු සංගමයේ ලියාපදිංචි අනුමත තක්සේරුකරුවකුගෙන් වාහන තක්සේරු වාතර්ාවක් ලබාගත යුතුය.<br>❖ නවතම වාහන සඳහා - ශ්‍රී ලංකාවේ නියෝජිතවරයෙකු ගෙන් ලබාගත් නාමමාත්‍ර ඉන්වොයිස් පත්‍රය (Pro forma invoice) ඉදිරිපත් කල යුතුයි.<br>❖ ආරක්ෂිත ඇප වශයෙන් වාහන සහ, ඉඩමේ ඇති ගොඩනැගිලි සැලකිල්ලට ගන්නේ නම්, එම වත්කමට අදාළ සියලු අවදානම් වලට එරෙහිව පූණර් ලෙස රක්ෂණය කර රක්ෂණ සහතිකය SMB ෆිනෑන්ස් පීඑල්සී ආයතනය වෙත පැවරිය යුතුය.<br>❖ ණය පිරිනැමීමේ ලිපියෙහි, පහසුකම් ගිවිසුමෙහි සහ අතිරේක නියමයන් සහ කොන්දේසි දක්වා ඇති ලේඛනයේ අඩංගු අනෙකුත් කොන්දේසි මේ සඳහා අදාල වේ. |

## 2.0 පොලී අනුපාත සහ දඩ ගාස්තු, අයකිරීම්, ගාස්තු සහ කොමිස්

- ❖ ණය පහසුකම් සඳහා අයකරන එලදායී පොලී අනුපාතය ගනුදෙනුකරුවාගේ ණය අවදානම් සාධක මත පදනම්ව ALCO වෙතින් කලින් කලට තීරණය කරනු ලබන අයකිරීම් පත්‍රිකාවෙහි සඳහන් අනුපාතයන්ට (Mark- up rates) අනුව සිදුවන අතර එම පොලී අනුපාත ආයතනය විමසීමෙන් ලබාගත හැකිය.
- ❖ ණය දීමේ පහසුකම් වගර්ය අනුව සඳහා පහත සඳහන් ගාස්තු අදාළ වේ;
  - CRIB ගාස්තු - සේවා ගාස්තු
  - මුද්දර ගාස්තු - තක්සේරු ගාස්තු
  - පරීක්ෂා කිරීමේ/පැමිණීමේ ගමන් ගාස්තු - රක්ෂණ වාරික
  - වත්කම් උකස් සඳහා අදාළ නීතිමය ගාස්තු - වත්කම් පැවරීමේ ගාස්තු - RMV ගාස්තු
- ❖ මුද්දර ගාස්තු, ශ්‍රී ලංකා ණය තොරතුරු කායර්ාංශයෙහි (CRIB) සහ මෝටරර්ථ කොමසාරිස් දෙපාතර්ාමේන්තුවේ (RMV) ගාස්තු අදාල බලධාරීන් විසින් නියම කරන පරිදි වේ.
- ❖ රජයේ බදු සහ අනෙකුත් ව්‍යවස්ථාපිත අයකිරීම් ගාස්තු අදාළ වේ.

## 3.0 පහසුකම් සහ සේවා ලබාගැනීමේ ක්‍රියාපටිපාටිය

ඔබගේ මූල්‍යමය අවශ්‍යතා පිළිබඳව අපගේ ප්‍රධාන කායර්ාලයට හෝ ළඟම ඇති ශාඛා කායර්ාලයට පැමිණ අපගේ කාය්‍යාර්මණ්ඩලය සමඟ සාකච්ඡා කර සහය ලබා ගත හැක. මූලික සාකච්ඡාවෙන් පසුව, අපගේ පහසුකම් හා සේවා සඳහා අයදුම් කිරීමට හැකි ගනුදෙනුකරුවන්හට අයදුම් පතක් සමාගම විසින් නිකුත් කරනවා ඇත. අයදුම් පත්‍රයෙහි සඳහන්ව ඇති අනෙකුත් අවශ්‍ය ලිපි ලේඛන සමඟ සම්පූණර් කරන ලද අයදුම් පත ලැබුනු පසුව, ගනුදෙනුකරු විසින් ඉල්ලා සිටින පහසුකමෙහි වගර්ය අනුව සකස් කර අයදුම්පත ඇගයීමට ලක් කරනු ලැබේ.
සුරක්ශිත/නීත්‍යානුකූල ලියවිලි සකස් කිරීම සහ නියමයන් සහ කොන්දේසි සපුරාලීම මත පහසුකම අනුමත කිරීම සහ ණය මුදල් ලබාදීම සිදු කරනු ලැබේ.

## 4.0 අදාළ නීතිමය විධිවිධාන

- ❖ පාරිභෝගික ණය පනත (1982 අංක 29) සහ පනතට අයත් සියලුම සංශෝධන
- ❖ මූල්‍ය කල්බදු පනත (2000 අංක 56) සහ පනතට අයත් සියලුම සංශෝධන
- ❖ සිවිල් නඩු විධාන සංග්‍රහය සහ සියලුම සංශෝධන
- ❖ 1949 අංක 6 දරන උකස් පනත

## 5.0 ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි විභාග කිරීම සඳහා වූ ක්‍රියා පටිපාටිය

SMB ෆිනෑන්ස් පීඑල්සී හි අපි තරඟකාරී පොලී අනුපාත, කඩිනම් සේවාවක් සහ අපගේ මනා පුහුණුව ලත් දක්ෂ කාර්යමණ්ඩලය විසින් ක්‍රමානුකූල සහ ඵලදායී ක්‍රියාවලියක් භාවිතා කරමින් අපගේ ගනුදෙනුකරුවන්ගේ පහසුව පරිදි සුදුසු වඩාත් කැමති මූල්‍ය විසඳුම් ලබා දීමට කැපවී සිටින්නෙමු. කෙසේ වෙතත්, ඔබ සෑහීමකට පත් නොවන යම්කිසි සේවාවක් සම්බන්ධයෙන් ඔබට පැමිණිල්ලක් තිබේනම්, ඔබගේ පැමිණිල්ල ලිපියක් මාගර්යෙන් ලිඛිතව, ඊමේල්, ෆැක්ස් හෝ වාචිකව දුරකථනයෙන් හෝ පහත සඳහන් නිලධාරියා වෙත පැමිණ මුණගැසීමෙන් හෝ අපගේ සියලුම ශාඛා වලින් ලබාගත හැකි ගනුදෙනුකරුවන්ගේ අදහස් හා යෝජනා දැක්වීමේ ආකෘතිපත්‍රය (CFF) සම්පූණර් කිරීමෙන් පැමිණිලි ඉදිරිපත් කළ හැකිය.

නයිජල් විජේසිංහ මහතා
ණය අංශ ප්‍රධානී
අංක : 282/1, CBS ගොඩනැගිල්ල,
ගාලු පාර,
කොළඹ 03
දුර කථනය - 0114 222 830 ෆැක්ස් අංකය - 0112 574 330
ඊ-මේල් - nigelw@smblk.com
වෙබ් අඩවිය - www.smblk.com

ඉහත නිලධාරියාට ලැබෙන පැමිණිලි වැඩ කරන දින 5ක් ඇතුලත ඒ සඳහා යොමුවිය යුතු අතර, එම පැමිණිල්ල දින 21ක් ඇතුලත විසඳිය යුතුය. SMB ෆිනෑන්ස් පීඑල්සී ආයතනයට දින 21ක් ඇතුලත පැමිණිල්ල විසඳීමට නොහැකි වන්නේ නම්, ඒ සඳහා උපරිම වශයෙන් මාස තුනක කාලයක් ගතවනු ඇති අතර, නිලධාරියා විසින් දීඝර් කාලයක් ගතවීමේ හේතු දක්වමින් ගැටළුව විසඳීමට ගෙන ඇති ක්‍රියාමාගර් පිළිබඳව ඔබව දැනුවත් කරනු ඇත.

එම විසඳුම ඔබගේ අපේක්ෂාවට අනුකූල නොවේ නම් හෝ ඔබ විසින් මතු කරන ලද ගැටළුව නියමිත කාලසීමාවන් තුළ විසඳා නොතිබුනේ නම්, ඔබගේ පැමිණිල්ල ඉදිරිපත් කිරීමට ස්වාධීන මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයෙකුගේ සේවය ඔබට ලබා ගත හැකිය. වැඩිදුර විස්තර සඳහා කරුණාකර මෙම ගනුදෙනු කරන කායර්ාලයේ නිලධාරියෙකුගෙන් විමසිය හැකි අතර, නැතහොත් ඔම්බුඩ්ස්මන් කායර්ාලය අමතන්න. සම්බන්ධතා විස්තර පහත පරිදි වේ.

මූල්‍ය ඔම්බුඩ්ස්මන් වරයා
අංක 143/A, වජිර පාර
කොළඹ 05
දුරකථනය - 0112 595 624 ෆැක්ස් අංකය - 0112 295 625
ඊ-මේල් - fosril@sltnet.lk
වෙබ්අඩවිය - www.financialombudsman.lk

SMB ෆිනෑන්ස් පීඑල්සී හි අප පිරිනමන අපගේ පහසුකම් සහ සේවාවන් පිළිබඳව විමසීමට පහත වේදිකා භාවිතා කළ හැක.

- අප අමතන්න: **+94 114 222 888**
- විද්‍යුත් තැපෑලෙන් සම්බන්ධ වන්න: **info@smblk.com**
- වෙබ් අඩවිය: **www.smblk.com**
- අප හමුවන්න: ප්‍රධාන කායර්ාලය, **SMB** ෆිනෑන්ස් පීඑල්සී, අංක. **282/1, CBS** ගොඩනැගිල්ල, ගාලු පාර, කොළඹ **03.**
- සතියේ දිනවල පෙ.ව.**8.30** සිට සවස **5.00** දක්වා ඔබට ඕනෑම **SMB** ෆිනෑන්ස් පීඑල්සී ශාඛාවකට පැමිණිය හැක.

.........................................
**ගනුදෙනුකරුගේ අත්සන**

**දිනය:**